# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்

ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)

தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*

මගේ අංකය : **PE/24/2015**
எனது இல.

ඔබේ අංකය :
உமது இல.

දිනය : 2015.07.03
திகதி

චක්‍රලේඛ අංක TR/2015/02

**සියළුම තේරීම් භාර නිලධාරී / දිස්ත්‍රික් ලේකම්,**

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17</u>**

**<u>මැතිවරණ රාජකාරී අතරතුරදී කාර්මික දෝෂවලට ලක්වන රජයේ වාහන අළුත්වැඩියා කිරීම.</u>**

**2015.08.17** දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම පිණිස ඔබ විසින් යොදාගනු ලබන රජයේ වාහනයක් හෝ ඡන්ද විමසීමේ රාජකාරී කටයුතු සඳහා යොදවා ගැනීම පිණිස ගෙන්වා ගන්නා ලද රජයේ වාහනයක් හෝ නිලධාරීන් විසින් රැගෙන එන ලද රජයේ වාහනයක් හෝ කාර්මික දෝෂයකට ලක් වුවහොත් එම වාහනය අළුත්වැඩියා කිරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව කාරුණිකව දන්වමි. කෙසේ වෙතත් විශාල අළුත්වැඩියාවන් සහිත වාහන ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යොදවා ගැනීමෙන් වැළකී සිටීම සුදුසු වේ.

02. I. සිදුවී ඇති කාර්මික දෝෂය පිළිබඳව හා සිදුකළ යුතු අළුත්වැඩියාව පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂක ලවා වාර්තාවක් ලබා ගන්න.

II. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත ගරාජ තුනකින් මිල ගණන් ලබා ගැනීමට කටයුතු කරන්න.

III. එම මිල ගණන් පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂකගේ නිර්දේශය හා ඔබගේ නිර්දේශය ද සමඟ නොපමාව **2868450/2868426** ෆැක්ස් අංක මඟින් සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවීමට කරුණාකර කටයුතු කරන්න.

03. එම වාර්තා හා මිළ ගණන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ අනුමැතිය ලබාදීමට කටයුතු කරනු ලබන අතර, එම අනුමැතිය ලද පසු වාහනයේ අළුත්වැඩියාව සිදුකර එම අළුත්වැඩියාව නිසි පරිදි සිදුකර ඇති බවට මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂක ලවා සහතික කරවා ගත යුතුවේ.

04. අළුත්වැඩියා කරන ලද වාහනයට අදාළ ලොග් පොතෙහි, සිදුකරන ලද අළුත්වැඩියාව පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීම පිණිස සම්පූර්ණ විස්තරයක් හා වැය වූ මුදල ද සඳහන් කර වාහනය අයත් ආයතනයේ ප්‍රධානියා වෙත දැනුම් දීමට කරුණාකර කටයුතු කරන්න. ඉන්පසු එම ලොග් සටහන් තැබූ බවට ලබාගත් ලිපියෙහි පිටපතක්ද, අළුත්වැඩියාව පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂකගේ වාර්තාවද, අවසන් බිල්පතේ පිටපතක්ද ප්‍රධාන කාර්යාලය වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

05. ඉහත 03 හි පරිදි අනුමැතිය ලද පසු මෙම අළුත්වැඩියාවට අදාළ බිල්පත නිරවුල් කිරීම සඳහා ප්‍රධාන ගණකාධිකාරී වෙත දැනුම් දී අවශ්‍ය ප්‍රතිපාදන, අදාළ වැය ශීර්ෂය යටතේ වෙන් කරවා ගත යුතු අතර, මැතිවරණ කටයුතු සඳහා යොදාගනු ලබන රජයේ වාහන හැර වෙනත් කිසිදු වාහනයක අළුත්වැඩියාවක් සම්බන්ධයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව මැදිහත් නොවිය යුතු බව ද කාරුණිකව සළකන්න.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

පිටපත් : 01. සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය - මාගේ අනුමත සීමාවෙන් ඔබ්බට වූ හදිසි අළුත්වැඩියාවකදී අවශ්‍ය කටයුතු කිරීමට

02. අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
03. ප්‍රධාන ගණකාධිකාරී - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා
04. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා
05. ගණකාධිකාරී (ගෙවීම්) - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@slelections.gov.lk*

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
*e-mail : info@slelections.gov.lk*